**වාවාකච්චේරි ප්‍රාදේශීය සභාව**

**යාපනය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වාවාකච්චේරි ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට වාවාකච්චේරි ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

වියදම , වත්කම් හා වගකීම් වලට අදාළව ගිණුම්වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම යටතේ පහත වගුවෙහි දැක්වේ.

**මූල්‍ය ප්‍රකාශන වලට බලපෑම**

| | වියදම | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 42,682 | 01 | 1,412,644 |
| වර්ගීකරණ දෝෂ | 01 | 298,784 | - | - | - | - |

## 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.660,496 ක් විය.

## 1:3:4 විගණනය සඳහා සාක්ෂි නොවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.881,699 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1:3:5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධාන වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132 වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආගමික හා පොදු වැඩ සඳහා වර්ෂයකට රු.1,000 ඉක්මවා වියදම් දැරිය නොහැකි වුවත් අනුමැතිය ලබාගැනීමකින් තොරව ආහාර පාන සඳහා රු.5,615 ක මුදලක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>140 රීතිය | රු.135,714 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි<br>අංක 571 | කල් ඉකුත් වූ තැන්පතු රු.1,448,473 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | අංක 8 දරන ප්‍රසම්පාදන නියෝජ්‍යතායතන චක්‍රලේඛය | රු.876,390 ක් වටිනා භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අදාළව ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,713,173 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,391,586 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම්

සභාපති විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 130 | 24 | 1,443 | 117 | 3,376 | 1,682 |
| බදු කුලී | 5,058 | 6,174 | 65 | 4,358 | 47 | 73 |
| බලපත්‍ර ගාස්තු | 195 | 1,331 | 15 | 195 | 234 | 6 |
| වෙනත් ආදායම් | 28,615 | 23,660 | - | 30,094 | 19,597 | 4 |

### 2:2:2 උසාවි දඩ මුදල්

2010 වර්ෂය සඳහා සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කරමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගල පඩිනඩි | 23,950 | 17,368 | 6,582 | 23,250 | 16,098 | 7,152 |
| අනෙකුත් | 59,181 | 4,108 | 55,073 | 17,261 | 3,764 | 13,497 |
| උප එකතුව | 83,131 | 21,476 | 61,655 | 40,511 | 19,862 | 20,649 |
| ප්‍රාග්ධන වියදම් | 23,500 | 2,362 | 21,138 | 7,350 | 2,943 | 4,407 |
| මුළු එකතුව | 106,631 | 23,838 | 82,793 | 47,861 | 22,805 | 25,056 |

### 2.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 04 | 03 |
| ද්විතීයික ශ්‍රේණිය | 20 | 21 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 48 | 45 |
| වෙනත් | - | 19 |
| | 72 | 88 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.4,484,172 ක් වු අතර, වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ රු.1,667,502 ක් විය.

### 2:5:2 අයවිය යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 උනට අයවිය යුතු සේවක ණය ශෙෂවල එකතුව රු.2,982,390 ක් වූ අතර, වර්ෂ 1 කට වැඩි කාලයක ඉක්ම වූ අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.8,320 ක් විය.

### 2.5.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා පැවතුණු අචල ජංගම වත්කම් වටිනාකම රු.99,446 ක් විය.

### 2.5.4 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවු 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.13,645,432 ක් විය.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පළාත් සභා නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,665,744 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර අදාළ කාර්යය සඳහා ප්‍රදානය කිරීමකින් තොරව එම මුදල ප්‍රාග්ධන වියදමක් ලෙස සලකා තිබුණි.

**2.7 කාර්ය සාධනය**

-----------------

වර්ෂය ආරම්භයේදී සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉටුකර ගත යුතු අපේක්ෂිත අරමුණු සහ ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කර ගත නොහැකි විය.

**2.8 අභ්‍යන්තර විගණනය**

-----------------------

ප්‍රාදේශීය සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). කොන්ත්‍රාත් පරිපාලනය

(ඈ). අයවැය පාලනය

(ඉ). මානව සම්පත්

(ඊ). වත්කම් කළමනාකරණය

(උ). මෝටර් වාහන උපයෝජනය